# එකතු වෙලා වැඩ කරලා වැඩි අස්වැන්නක් ලැබිලා

ගොවිතැන් කටයුතු කරන කොට අපි හුඟ දෙනෙක් පුරුදු වෙලා තියෙන්නෙ තම තමන්ගෙ ගොවිතැන් කටයුතු තනි තනිව කර ගන්නයි. කුඹුරු යායක් ගැන සලකල බැලුවහම, එක ලියද්දක් වැඩ කරන කෙනෙක් සමහරවිට වෙලාවට වපුරනව. ඒ උනාට ඒ යායෙම තවත් කෙනෙක්, නොයෙකුත් හේතූන් නිසා ඊට ටිකක් පරක්කු වෙලා තමන්ගෙ ලියැද්ද වපුරනව. තවත් ගොවි මහතෙක් කලට වෙලාවට පෝර දනව; එම යායෙම වෙනත් ගොවි මහතෙක් පෝර යොදන්න ප්‍රමාද වෙනව; තවත් කෙනෙක් නැති බැරිකම හින්ද කොහොමටත් පෝර යොදන්නෙම නැහැ. මේ විදිහට ගොවිතැන් කරගෙන ගියාම සමහර හොඳින් වැඩ කරපු ගොවි මහතාට හොඳ අස්වැන්නක් ලැබෙනව; අනෙක් අයට එච්චර අස්වැන්නක් ලැබෙන්නෙ නැහැ. පොදුවේ මුළු යායම ගැන සලකපුවහම සාමාන්‍ය අස්වැන්න අඩුයි. ඒ වගේම එක ගොවි මහතෙක්වත් කලට වෙලාවට රෝග උවදුරු ආදිය මර්දනය නොකළොත් ඇතැම්විට එක ලියැද්දකින් පටන් ගන්න කෘමි උවදුරකින් මුළු යායම විනාශ වී යාමේ තර්ජනය පවතින්න පුළුවනි.

## බෙත්ම

මේ තත්ත්වය ගොවි මහතුන්ගේ තත්ත්වයෙන් බලන කල මීට වඩා යහපත් කර ගන්න මාර්ගයක් නැද්ද? ඉස්සර කාලෙ නම් 'කයිය', 'බෙත්ම', ආදි ක්‍රම මගින් යායක සැම දෙනාම එක් වී එකම අවස්ථාවක තම තමන්ගේ ගොවිතැන් කටයුතු සහයෝගයෙන් ඉටු කර ගත්ත අවස්ථා තිබුන බවට සාක්ෂි තියනවා. මේ වැනි සිරිත් විරිත් දැන් හුඟක්දුරට විනාශ වෙලා ගිහිල්ලා, ගොවිතැන් කටයුතුවලදිත් ඉස්මතු වෙලා තියෙන්නෙ පෞද්ගලිකත්වයයි.

ජපානය, පෝලන්තය වාගෙ රටවල සමූහ නිෂ්පාදනය කියන ක්‍රමය මගින් පලදාව වැඩි කර ගන්නා ක්‍රියා මාර්ගයක් ආරම්භ කරල තියෙනව. සමූහ නිෂ්පාදනය කියන්නෙ, කුඹුරුයායක හරි, ගොඩ ගොවිතැනේදී හරි ඒත් නැතිනම් සතුන් ඇති කිරීමේ ව්‍යාපාරයකදී ගොවීන් කිහිප දෙනෙක් එකට එකතු වෙලා කලින් එකඟ වෙන පොදු වැඩසටහනකට අනුව තමන්ගෙ ව්‍යාපාරය කරගෙන යාමයි. මෙහිදී ඉඩමේ අයිතිය ගැන මොනම වෙනසක්වත් සිද්ද වෙන්නෙ නැහැ. ණය, පෝර ආදිය කලට වේලාවට ලබාගැනිම හා සමූහයක් වශයෙන් එකම අවස්ථාවක වගා කටයුතු ආදිය කිරිම පහසු කරවා ගැනිමේ පරමාර්ථයෙනුයි මේ වැඩ පිළිවෙල යොද ගත්තෙ. මෙය සාර්ථක වැඩපිළිවෙලක් බව දැන් ඔප්පු වෙලා.

## බැමිණිවත්ත

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය සමූහ නිෂ්පාදනය ගැන අත්හදා බැලීමක් කෑගල්ලේ බැමිණිවත්තේ ආයතනයේ ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානයේදී සිදු කළා. ගොවීන් 18 දෙනෙක් වැඩ කරන අක්කර 16 ක පමණ කුඹුරු යායක ගොවීන් එක් කරල සමූහයක් සංවිධානය කරල, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ උපදෙස් අනුව හා බැමිණිවත්ත පලදාවර්ධන කමිටුවේ මෙහෙයවීම යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ත අංශයේ නිලධාරීන්ගේ සහයෝගයත් ලබාගෙන මෙම වැඩපිළිවෙල දියත් කළා. කලින් නියම කර ගත් කාලසටහනකට අනුව සියළුම ගොවිතැන් කටයුතු කිරිමටත්, සමූහයට ලබා දුන් ණය, 10% ක පොලියක්ද ඇතුව, අස්වැන්න ලබා ගත් පසුව ආපසු ගෙවීමටත් මෙම ගොවි සමූහය පලදාවර්ධන කමිටුව සමඟ ගිවිසුමකට එකඟ උනා.

මේ විදිහට ගොවිතැන් කටයුතු කරල 1974/75 මහ කන්නයේදී අක්කරයකට බුසල් 32 ක් හැටියට ලැබුන අස්වැන්න 1975/76 මහ කන්නයේදී අක්කරයකට බුසල් 75 ක් දක්වා වැඩි කර ගැනීමට මේ සමූහයේ ගොවි මහතුන්ට පුළුවන් උනා.

මේ විදිහටම බැමිණිවත්ත ප්‍රදේශයේ කෙසෙල් සිටුවීමට ව්‍යාපාරයක් හා කුකුලන් ඇති කිරීමේ වැඩපිළිවෙලක්ද ආයතනයේ මෙහෙයවීම යටතේ සිදු කළා. මේවායින් සෑහෙන්න සාර්ථක ප්‍රතිඵල ලැබුන නිසා මේ අත්දැකීමේ විස්තර අනෙකුත් අයටද දැන්වීමට අපි අදහස් කළා. මේ සමූහ නිෂ්පාදන අත්දැකීමේ විස්තරත්, එය ඉටු කළ යුතු ආකාරයත්, අනෙකුත් රටවල සමූහ නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කරන පිළිවෙලත්, සමූහ සඳහා උපදෙස් ආදියත් ඇතුළත් ප්‍රකාශනයක් දැන් ආයතනය විසින් නිකුත් කර තියෙනවා. ගොවිකටයුතු සැළසුම් කරන රජයේ නිලධාරීන්ට හා විශේෂයෙන් පලදූ කමිටු හා ගොවිකාරක සභා සාමාජිකයින්ට මෙය ඉතාමත් ප්‍රයෝජනවත් වෙන්න පුළුවනි. මෙම ප්‍රකාශනය දැන් ආයතනයෙන් ලබා ගත හැකිය.

---

# බලන් නෑනෝ ඉපනැල්ලක සෝබාවේ

කුරක්කන් දෙකයි වැපුරුවෙ    උක්කුරාලේ
කපා ගන්ට බැරි අතපය    රුදවේ
ඇරිලා ගියොත් ගම ඔක්කොම    හිනාවේ
බලන් නෑනෝ ඉපනැල්ලක    සෝබාවේ

නෑනෝ නෑනෝ අපි දෙන්නා    එකතුවෙමු
ගිගිරි බැඳපු පන් කැති සූරතට    ගනිමු
හේනේ ගොහින් ඉන් දෙක දැලේ    බලමු
ඉතින් නෑනේ නෑ වර පදමට    කපමු

අටිය වඩන මගෙ පද අහපන්    රාලේ
වට්ය පවුම් තුනකට දෙන්නට    කෝලේ
කොටියට කන්ට එතනට පෙනුනද    රාලේ
පිටිය ගලාගෙන යනවා කිරි    අතලේ

පැලේ පැලේ මම සිටිනා    කුරක්කන්
ඌරෝ ඇවිත් වටපිට කරන    සක්මන්
වැටටත් උඩින් උන් අල්ලන    මලක්කන්
ආසයි මගේ කිරි වදිනා    කුරක්කන්

හේවා හැටේ ඇත්තන්ගේ    නරක්කන්
පැල පැල වපුරති තැන    කුරක්කන්
උදු මාලුත් දෙහි ඇඹුලුත්    පදක්කන්
වේලක් කන්ට ඇත රැවුලේ    කුරක්කන්

අනේ මගේ කිරි වදිනා    කුරක්කන්
ඌරන් ඇවිත් වැට ළඟ කරන    සක්මන්
වැටට උඩින් උන් එනවා    වලක්කන්
පන තිබුනොත් වපුරන්නේ    කුරක්කන්

පාන්දරම මා පිනි පිට යන    කලට
කිරිල්ලියෝ පැන පැන කනි කරල්    පිට
හෝයි හෝ ගාන කොට ඉඟුලුනු    කලට
තවත් නොඑමි මේ ගම ගොයිද    වැලකට

කුරක්කනට නිසි අහනේ බැහැ    පල්ලා
වරෙන් අපෙන් කව් සිව්පද    අහපල්ලා
නරක් නොවී අඩදබරත්    නොකරල්ලා
කුරක්කනට අත කඩිනම්    කරපල්ලා

උඩහ ගෙදර ඩිංගිරි නෑනගේ    හේනේ
හුඹහ මුදුනෙ ලා දෙසි මල    පෙනෙන්නේ
ගිරා මලිති පැණි බොන්නට දුව    එන්නේ
පුරා කමත් කුරහන් ගොඩ    ගසන්නේ

කපා කුරක්කන් කමතට ගෙන    ආවා
පිට්ටු මල්ල දැකලා බඩගිනි    ආවා
තට්ටි නෑනෙ දුන් ඉර මුදුනට    ආවා
පිට්ටු කන්ට වර දුන් බඩගිනි    ආවා